# අභිමතාර්ථ සාධනයෙහි ලා පූජාවලි කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය (පූජාවලියේ පරිච්ඡේද කිහිපයක් ඇසුරෙනි)

එච්.ඒ. ගිහාන් මධුසංඛ

Pujavali was written by Maurapaada parivenadipati Buddhaputhra thero in the 13th century, during the era of king Parakramabahu the second (1228-1269). The text was based on one of the distinctive qualities of Lord Buddha, namely Arahan, meaning uniqueness. Showing the king the path for enlightenment is identified as the practical reason for writing this celebrated book. In order to fulfill his purpose, the author has selected many examples from the life of Lord Buddha. The aim of this study is to examine the narratology of the text in relation to the writing methods that have been used by the author to achieve his main objective.

---

© එච්.ඒ. ගිහාන් මධුසංඛ

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

දඹදෙණි අවධියේ විසූ කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු හෙවත් දෙ වැනි පැරකුම්බාවන්ගේ (ක්‍රි.ව. 1225-1269) රාජ්‍යෝදයෙන් තිස් වැනි වර්ෂයේ දී පූජාවලිය රචනා විය. සිංහල සාහිත්‍ය වංශය තත් කෘතිය රචනා වූ කාලය නිශ්චිත ලෙස ම දක්වන්නේ ක්‍රි.ව. 1266 වශයෙනි.[1] පූජාවලිය, කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරලයේ වාකිරිගල මයූරපාද පරිවෙණාධිපති ව වැඩ විසූ බුද්ධපුත්‍ර හිමියන්ගේ කෘතියක් ලෙස හඳුනාගැනෙයි.[2] කර්තෘත්වය, කාලය, නිමිත්ත ආදිය සෙසු පුරාතන ග්‍රන්ථ තරම් වෙහෙසකර නො වන්නේ කතුවරයා සිය කෘතියේ ම ඒ පිළිබඳ සඳහන් කරන බැවිනි. ගොඩකුඹුර හා සන්නස්ගල පවසන්නේ මෙහි කතුවරයාගේ නාමය තමන් ආධිපත්‍යය හෙබවූ ආයතනයේ නාමයෙන් විනා පැවිදි නාමයකින් නො පැවැසෙන බව යි. පූජාවලියේ දී බුද්ධපුත්‍ර හා සුගතෝරස යනුවෙන් ද මේ හිමියන්ගේ කෘතියකැ යි සැලැකෙන යෝගාර්ණවයේ තථාගත පුත්‍ර ලෙසින් ද සඳහන් වන බැවින් ඕනෑ ම භික්ෂුවක් පොදුවේ බුද්ධපුත්‍ර ලෙස හඳුන්වන ආකාරයට වඩා මෙහි විශේෂ පුද්ගල නාමයක් ඇතුළත් නො වෙතැ යි පැවැසෙයි. නිකාය සංග්‍රහය ද මයූරපාද යන නාමය දක්වන බව මෙහි දී අවධානයට පාත්‍ර කටයුතු ය.[3] මේ ලිපියේ අපි ද කතු හිමියන්ගේ නාමය මයූරපාද ලෙසින් ම භාවිත කරමු.

මෙහිමියන් රචිත තවත් කෘති දෙකක් වෙතැ යි පූජාවලි සංස්කරණයක් කළ කිරිඇල්ලේ ඥාණවිමල හිමි මෙන් ම පැරැණි සාහිත්‍යය පිළිබඳ පර්යේෂණයේ යෙදුණු ගොඩකුඹුර හා සන්නස්ගල ද පවසති. ඒ කෘති ද්වයය දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ මහෝපකාරී වන යෝගාර්ණවය හා ප්‍රයෝගරත්නාවලිය යි. වෛද්‍යාචාර්යවරයකු ද වූ මයූරපාදයන් කළ කෘති තුන දෙ මඟක ගිය බවක් පෙනෙයි. එනම් පූජාවලිය මානසික ව්‍යාධියෙන් හෙවත් සංසාරගත තෘෂ්ණා රෝගයෙන් පෙළෙන්නවුන් ඉන් මුදවා ස්වර්ග, මෝක්ෂ සම්පතෙහි පිහිටුවීම උදෙසාත් සෙසු වෛද්‍ය ග්‍රන්ථ ද්වයය කායික රෝගයෙන් පෙළෙන්නවුන් සුව කරනු පිණිසත් රචනා කිරීම ය. මෙහි දී පුද්ගලයාගේ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය යෙහෙන් පැවැතීම මානසික සුවය ජනිත කිරීමට ඉවහල් වන බව කතු හිමියන් ප්‍රතිවේධ කොට සිටි බව ද හැඟී යයි.

පූජාවලි යන්න පූජා වැල හෙවත් පූජා සමූහය යන වාච්‍යාර්ථ දනවයි. මයූරපාද පරිවේණාධිපතීන් මේ ග්‍රන්ථය රචනා කළේ නව අරහාදී බුදු ගුණ අතර එන අරහං ගුණය පාදක කරගෙන යි. එහි අර්ථය නම් පූජා ලැබීමට සුදුසු හෙවත් යෝග්‍ය වූ යන්න යි. පුරිසදම්මසාරථී බුදු ගුණය පෙර දැරි කරගත් අමාවතුරට පසු ව ඒ මාර්ගය ම අනුගමනය කරමින් ලියූ දෙ වැනි කෘතිය මෙය යි. පූජා මාත්‍රය වනමින් සනරාමර ලෝකයා විසින් කරන ලද නොයෙක් පූජාවලට බුදු රදුන් අග්‍ර දක්ෂිණෙය්‍ය බව් සනාථ කරමින් පරිච්ඡේද තිස් හතරක් වන සේ මේ කෘතිය රචනා වී ඇත. බුදු රදුන් එසේ ලැබූ පූජා වර්ග තුනක් මෙයින් හඳුනාගත හැකි ය. එනම් පාරමිතා පුරන බෝධිසත්ත්වවරයකු ලෙස ලැබූ පූජා, බුද්ධත්වය සාක්ෂාත් කිරීමෙන් පසු පන් සාලිස් වසරක් තිස්සේ ලැබූ පූජා, පරිනිර්වාණයෙන් පසු භාරතීය හා ලක් වැසි රජුන්ගෙන් ලැබූ පූජා වශයෙනි. මෙකී පූජා බුද්ධ දේශනාව අනුව ආමිස හා ප්‍රතිපත්ති වශයෙන් දෙ කොටසකි. ප්‍රත්‍යාදියෙන් කරන සත්කාර පූර්වක සංග්‍රහ ආමිසය වශයෙන් ද ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂා පූරණය කිරීම ප්‍රතිපත්ති පූජාව ලෙස ද සැලැකෙයි. පූජාවලියේ වැඩි වශයෙන් අවධානයට පාත්‍ර ව ඇත්තේ ගුණ මූලික වූ ප්‍රතිපත්ති පූජාව ම බව පෙනෙයි. **ප්‍රතිපත්ති පූජාවෝ උතුම් වූ පූජා වෙති යි**[4] එහි දැක්වේ. පූජාවලියේ හැම පරිච්ඡේදයක් ම සමාප්ත වන්නේ විශුද්ධිමාර්ගයෙන් උකහාගත් ''**පූජා විසේසං සහ පච්චයේහි**'' යනාදි ගාථා පාඨයෙනි.

කෘතිය රචනා කිරීමට පැරකුම් රජුගේ දේවප්‍රතිරාජ අමාත්‍යවරයා ඇරියුම් කළ පුවත එහි සඳහන් වෙයි. ඊට හේතු වූයේ බුද්ධත්වය ප්‍රාර්ථනා කරන ලෙස දළදා පූජාවෙන් සිතේ බුද්ධාලම්භන ප්‍රීතිය වඩවාගෙන විසූ දෙ වැනි පැරකුම්බා රජුගෙන් තත් අමාත්‍යවරයා අයැද සිටිය ද අසීම පුත්‍ර ස්නේහයෙන් මඩනා ලද රජු ඊට නො කැමැති වීම යි. ගෞතම බුදු රදුන් පුත්‍ර ස්නේහාදිය හැරදමා බුදුකුරුදම් පුරමින් අභිසම්බෝධිය සාක්ෂාත් කළ අයුරු කියැවෙන බණක් රජුට වදාළ මැනවැ යි දේවප්‍රතිරාජයා මයූරපාද පරිවේණාධිපති හිමියන්ගෙන් ඉල්ලා සිටියේ ය.[5] කතුවරයා තත් කෘතිය රචනා කිරීමට පෙලැඹවූ ප්‍රධාන හේතු සාධකය එය යි. ඊට අමතර ව සිය කෘතියේ ප්‍රථමාර්ධයේ දී ග්‍රන්ථ සම්පාදකයකු අපේක්ෂිත ලෝවැඩ මොනවා

දැ යි කරුණු අටක් ඔස්සේ ඉදිරි පත් කර ඇත. හෙළ බසින් ගද්‍ය කෘතියක් රචනා කිරීමෙන් අත් විය හැකි ප්‍රතිඵල සාර සංගෘහීත කළ ප්‍රථම හා එක ම අවස්ථාව ද මේ යැ යි පෙනෙයි. ඒ කරුණු අට වැදැගත් වන්නේ කතුවරයාගේ සකලවිධ පරමාර්ථ එහි දී අනාවරණ වන බැවිනි. පහත දක්වා ඇත්තේ ඒ කරුණු අටෙහි සාරය යි.

- අවිවේකී පාලක පක්ෂයට විවේකයක් ලැබුණු පසු හුදෙකලා ව කියවා ආත්මාර්ථ සාධනය කළ හැකි වීම.
- රජ, බිසෝ ආදි උසස් කතුනට සිත් සේ ඇවිද බණ අසා පින් රැස් කිරීම උගහට බැවින් කෘතිය කියවා පින්කමෙහි යොමු විය හැකි වීම.
- මහාමාත්‍යාදී රාජකාරි බහුල නිලධාරීනට ධර්ම ශ්‍රවණය සඳහා කාලය අඩු බැවින් තත් කෘතිය කියවා ධර්මය අවබෝධ කරගත හැකි වීම.
- උසස් පදවි ලත් භික්ෂූන් වහන්සේලාට පූර්ව ව්‍යවහාර වාක් ප්‍රබන්ධ දැන නුවණ තියුණු කරගත හැකි වීම.
- විදර්ශනාවට පමණක් සිත් යොමු කළ අක්ෂර අභ්‍යාස විරහිත භික්ෂූනට නුවණ හා සැදැහැ වැඩි කරගැනීම.
- ධර්ම දේශනා කරන භික්ෂූනට නොයෙක් අර්ථ ව්‍යාඛ්‍යාන නිපදවීම.
- අකුරු දන්නා සත්පුරුෂයන් නිවැරැදි ජීවිත පැවැත්මකට යොමු කිරීම.
- නො දියුණු පෙදෙස්වල සැදැහැති ජනයාට අනුන් කියවනු අසා දෙ ලොව දියුණුව සලසාගැනීම.[6]

දඹදෙණි පැරකුම්බාවන් ලවා බුද්ධත්වය ප්‍රාර්ථනා කළා මෙන් ම මේ කෘතිය රචනා කිරීමේ පින් මහිමයෙන් මයූරපාද පරිවේණාධිපති හිමි ද බුද්ධත්වය ප්‍රාර්ථනා කළේ ය.[7] මධ්‍යතන ලංකාවේ ව්‍යාප්ත ව තිබූ මහායාන ධර්මයේ බලපෑම පූජාවලි කතුවරයාගේ පරමාර්ථයෙන් විශද වෙයි. මහායානය, ථෙරවාදය සමඟ මිශ්‍ර වීමක්; විශේෂයෙන් ම පූජා විධික්‍රම හා සංකල්පවල සම්මිශ්‍රණයක් පළමු වැනි වරට දක්නට ලැබෙන්නේ දඹදෙණි අවධියේ ය. මහායානයේ ප්‍රසිද්ධ ඉගැන්වීමක්

වන බෝධිසත්ත්වයානය පූජාවලියෙන් ඉස් මතු වී පෙනෙයි.[8] කෘතිය රචනා කොට දේවපතිරාජ අමාත්‍යවරයා ලවා එය රජුට පිළිගැන්වීමෙන් ඉක්බිති රජතුමා දෙ වැනි රාජ්‍යයක් ලද්දා සේ ඉමහත් ප්‍රහර්ෂයට පත් ව බිසොවුන් සමඟ මඟුලැතු පිට තබා මහ පෙරහර පවත්වමින් දෙ පෝයක් මුළුල්ලේ උත්සව කළේ යැ'යි පූජාවලියේ සඳහන් වේ.[9] මේ පුවත මහාවංසයේ ද පැනෙන අතර මාර්ටින් වික්‍රමසිංහ ඒ අදහස විමසුමට ලක් කරමින් කියා සිටින්නේ පූජාවලිය ජනයා අතර මේ තරම් ප්‍රසාදයකට හා ප්‍රචාරයකට පත් වීමට තත් කාලීන අධ්‍යාපන ක්‍රමයේ දියුණුව මෙන් ම ඉහළ රුචිකත්වයෙන් හෙබි රසික පිරිසක් සිටීම ද එක සේ හේතු කාරක ව තිබූ බව යි.[10]

පූජාවලියේ සාහිත්‍යයික අගය පිළිබඳ සිදු කරන විමසුම්වල දී පෙනී යන්නේ ඇතැම් විචාරකයන් ඊට පූර්ව කාලීන හා සම කාලීන කෘති සමඟ කෘතිය සසඳා බලා එය සාහිත්‍ය අගයෙන් හීන නිර්මාණයක් යැ යි නිර්ණය කරන බවකි. සිංහල සාහිත්‍යයේ නැඟීම කෘතියේ දී මාර්ටින් වික්‍රමසිංහ සිදු කරන නිර්දය විවේචනය ඒ අතර ප්‍රමුඛ වේ. ඔහු පවසන ආකාරයට ලක් දිව චිරන්තන ගද්‍ය කලාවේ කනිෂ්ඨ සම්ප්‍රදායයේ ආරම්භය පූජාවලිය යි.[11] පූජාවලිය තනි කෘතියක් සේ සලකා කරන විචාරයේ දී බුත්සරණ රීතිය කවිත්වයෙන් තොර වූ ධර්ම දේශකයන් අතින් දූෂණය වුණු සැටි පූජාවලියෙන් හෙළි වේ යැ යි හෙතෙම සඳහන් කරයි.

විද්‍යාචක්‍රවර්තීනට වඩා පූජාවලි කතුවරයා බුද්ධි හීනයකු බව හෙතෙම පවසන්නේ ගද්‍ය කාව්‍යයක පැවැතිය යුතු ප්‍රසාදාවහ ගුණයත්, බුද්ධිගෝචර ස්වරූපයෙන් ජීවන ප්‍රවෘත්ති කථාවට නො නංවා හුදු භක්තිය දනවන දේවකථාවලියක් ඉදිරි පත් කළේ ය යන චෝදනාවෙන් ඊට දමා ගසමිනි. අමාවතුරෙහි හෝ බුත්සරණෙහි බස තරම් පූජාවලියේ බස උසස් ලෙස නො සැලැකේ යනුවෙන් තලල්ලේ ධම්මානන්ද හිමි ද මීට සමාන අදහසක් ඉදිරි පත් කර ඇත.[12] එහෙත් දේවකථා හා ප්‍රාතිහාර්ය වර්ණනා අතින් පූජාවලි කතුවරයා විද්‍යාචක්‍රවර්තීන් අබිබවා යන බව වික්‍රමසිංහ ද පිළිගෙන ඇත.[13]

පූර්වකෘත විස්තර හා මතවාද ඔස්සේ අපගේ විමර්ශනය රෝපණය කිරීමට සුදුසු මාධ්‍යයක් සකස් විණැ යි සිතමු. පූජාවලි කතුවරයාගේ අභිප්‍රාය වූයේ සාහිත්‍ය වටිනාකමින් අනූන, මානව ජීවිතය විවරණය කරන්නා වූ කෘතියක් සම්පාදනය කිරීම නො වේ. දෙ වැනි පැරකුම්බාවනට බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම රුචිකර වන අන්දමේ බණක් ගද්‍යයෙන් රචනා කිරීමත් යට දක්වන ලද ප්‍රතිඵල සාධනයත් මාගධී භාෂාවෙන් සංක්ෂිප්ත ව සැඟව තිබූ සද්ධර්මයට ස්ව භාෂාවෙන් අර්ථ ව්‍යාඛ්‍යාන උපදවීමත් ය. මෙකී පරමාර්ථ මුදුන් පමුණුවාලීම උදෙසා කතුවරයා සිය ග්‍රන්ථය අරහං බුදු ගුණය නැමැති එක ම තේමාවක් ඔස්සේ විකාසනය කළේ ය. එකී පරමාර්ථ සාධනය උදෙසා මයූරපාද පරිවෙණාධිපති හිමියන් දැක්වූ සාමර්ථ්‍යය විමසනු වස් පූජාවලියේ එන පූර්වාරාම පූජා කථා, අසදෘශ මහා දාන පූජා කථා, දිව්‍යරාජ පූජා කථා, යමක ප්‍රාතිහාර්ය පූජා කථා හා සමමෙත් නොයෙක් ජාතිභේද පූජා කථා යන පරිච්ඡේදවලින් නිදසුන් කිහිපයක් ගෙන හැර දක්වමු.

ප්‍රධාන කථා තේමාව පරිච්ඡේදයේ නම වශයෙන් දැක්වුව ද කතුවරයා ඒ හා බැඳුණු ඉතා කුඩා සිදුවීමක් පවා ඇසුරු කොට පරිකථාවක් නැත හොත් අතුරු කථාවක් උපයෝගී කරගනිමින් බුදු සිරිත උත්කර්ෂයට පැමිණවීමට මඟ පාදාගනියි. කතාන්තර ස්වරූපයේ රසවත් පරිකථා උපාර්ජනයෙන් ශ්‍රාවකයාගේ අවධානය රඳවා තබාගැනීමට සමත් වී ඇති බව කිව මනා ය. එසේ අතුරු කතා පුවත් ඉදිරි පත් කිරීමේ දී ප්‍රධාන තේමාව සමඟ මනා සේ ගැළපෙන අවස්ථා තෝරාගැනීමට තරම් විවේක බුද්ධියක් ලැබූයේ බණ මඩුව ඇසුරෙන් විය යුතු ය.

දිව්‍යරාජ පූජා කථා හෙවත් දෙ විසි වැනි පරිච්ඡේදයේ දී අප බුදුන් තව්තිසා දෙව් ලොවේ දී සක් දෙව් රජුන්ගෙන් ලද පූජෝපහාර දැක්වීමේ අරමුණින් කරන රචනය; මඳක් තැන් ගිය කල සනත්කුමාර නම් බ්‍රහ්ම රාජයා දෙව් ලෝ බැස පඤ්චශිඛයාගේ වෙසින් බණ කියන්නට වූ හේතු කාරණා පැවැසීම දක්වා විස්තෘත කර ඇත. එහි දී පඤ්චශිඛ දෙව් පුත් ගැන මෙසේ දක්වයි.

"ඒ තෙමේ ගිය දවස මිනිස් ලොව පස්කුඩුම්බියක් ඇති ව එහි පස් කොණ්ඩයක් බැඳ බාල කල ගොපල්ලන්ට නායක ව කෙළ ඇවිදිනේ සෙසු කොල්ලන් එක් කොට ගෙන තුන්මං සතරමං සන්ධියෙහි මල්පැල් නඟා වළ ගොඩ තැන් තනා..." 14

මෙසේ පරිකථා යොදමින් අවසන පඤ්චශිඛයා මතු නො ව ඔහුගේ ස්වාමියා වූ සක් දෙවිඳුන් ද බුදුන් වෙතින් දිගාසිරි ලබා ඉමහත් ගෞරවයෙන් යුතු ව බුදුන් පිදූ අයුරු දක්වා ඇත්තේ බුදු රජාණන් වහන්සේ අරහං ගුණ නාමයට සාකල්‍යයෙන් ම යෝග්‍ය යැ යි හඟවමිනි. අසදෘශ මහා දාන පූජා කථාවල ආනන්ද බෝධි පූජා නම් කවරේ දැ'යි පවසමින් සිට අවස්ථාව ලද සැණින් බන්ධුල මල්ලිකාවගේ ශ්‍රද්ධා සම්පන්නභාවය හා ඇගේ සැමියා වූ බන්ධුල සේනාපතිගේ ශෞර වීර්යය ගැනත් වර්ණනා කිරීමට පෙළැඹී ඇත. ඉන් නො නැවතී කෙසොල් රජ බුදු රදුන් හා ඥාතියකු සේ සමීප වීමේ පුවතත් රජුගේ අග බිසව වූ කෝසල මල්ලිකාවගේ උත්පත්ති කථාවත් ගෙන හැර දක්වන්නේ ශ්‍රාවක හා පාඨක ජනයා කථා රසයේ ගිල්වාලමිනි. පූර්වකෘත පුණ්‍ය මහිමය හේතුවෙන් එබඳු ජනප්‍රිය චරිත කීර්තියෙන් බැබැළි බව පැවැසීම ද මයූරපාද හිමියන්ගේ අරමුණකි. හෙතෙම උසස් තානාන්තර දරන්නවුන් අතර බුද්ධාලම්භන ප්‍රීතිය ඔද වඩවනු රිසි කතුවරයකු බව නො වළහා කිව හැකි ය.

මයූරපාද පරිවේණාධිපති හිමි දහම් දෙසන විට සත්පුරුෂයන්ගේ වැඩි අවධානයට ගොදුරු වනුයේ කිනම් අකාරයේ අවස්ථා ද යනු තෝරා බේරාගැනීමට තරම් පැසුණු අත්දැකීම් සහිත යතිවරයෙකි. උස් හඬින් වැඩිපුර සාදුකාර දෙන අවස්ථා සනිටුහන් කරගත් උන් වහන්සේ තම බණ පොත එවැනි අවස්ථාවලින් සමෘද්ධිමත් කිරීමට ක්‍රියා කළ සේක. පූජාවලිය තරම් බුද්ධ ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාව දියුණු වීමට ඉවහල් වන ස්ව භාෂාවෙන් ලියූ අන් එක ද ග්‍රන්ථයක් හෝ නැතැ යි කිරිඇල්ලේ ඤාණවිමල හිමියෝ පවසති.[5] දෙ වැනි පැරකුම් රජු පොලඹවනසුලු බණක් කීම මයූරපාද පරිවේණාධිපති හිමිගේ පරමාර්ථය බව් මෙහි දී අමතක කළ නො හේ. බුත්සරණ, දහම්සරණ වැනි අනුයාත-පූර්ව අවධියේ විරචිත බණකථා කෘති පරදවමින් විටෙක එය නැඟී සිටින්නේ ද එබැවිනි.

ශ්‍රද්ධාව දියුණු කිරීමේ අරමුණින් පුරාණ වෛදික ග්‍රන්ථයක තරම් රසවත් දේවකථා ප්‍රවෘත්ති රාශියක් ඉදිරි පත් කිරීමට කතු හිමියන් උත්සාහ ගෙන ඇත. බෞද්ධ කථාවලට දේව සංකල්ප ප්‍රවේශ වීමක් වශයෙන් ද පූජාවලිය හඳුනාගත හැකි ය. විස්මය උපදවන දේවකථාදියෙහි අද්භූතජනක සිද්ධි ද දැකගත හැකි ය. මිහිපිට මහා රාජ්‍යයක විසිතුරු හා ත්‍රිපිටකාගත තොරතුරු එකිනෙක පාහමින් ඇසින් දුටුවකු සේ තව්තිසා දිව්‍ය ලෝකයේ පිහිටීම ගැන දක්වන විස්තරය එබන්දකි.

> "ඒ දෙවුලොව පටන් දෙසාලිස් දහසක් යොදනින් මත්තෙහි මෙර මුදුන හා සම වූ ආකාශයෙහි තවුතිසා භවනය සක්වළගල දක්වා පිහිටියේ ය. ඒ මෙර මුදුන ඉන්ද්‍රනීල මාණික්‍යමය ය. එහි පිහිටි පිටිනුවර හැර මැද පිහිටි ශක්‍රපුරය ම නැගෙනහිරි රුවන් වාසල පටන් බස්නාහිරි රුවන් වාසලට දසදහසක් යොදුන..." [16]

ශක්‍රයාගේ සම්පත් ප්‍රමාණය එක් මුවකින් තබා දහස් මුවකින් පැවැසුව ද නිමවාලිය නො හැකි බව පැවැසේ. ඔහු ඒ සඳහා කරන ලද පින් කම් රාශියක් පෙන්වාදී ඇත්තේ ඒවා අනුගමනය කිරීමෙන් සත්පුරුෂයනට ද දිව්‍ය සම්පත් ළඟා කළ හැකි බව සනාථ කරනු පිණිස ය. රෝහිණී නම් අතිශය සුරූපී දිව්‍යාංගනාව කෙරෙහි ඇති ප්‍රේමය අරභයා දෙව් පුතුන් සිවු දෙනකු අතර ඇති වූ ගැටුම සංසිඳවීමට ශක්‍රයා ක්‍රියා කළ ආකාරය සහෘදයනට හාස්‍ය රසයත්, ඊට නො දෙ වැනි අද්භූත රසයත් ජනිත කරමින් ඉදිරි පත් කර ඇත. ශක්‍ර දේවේන්ද්‍රයා හා ඔහුගේ නියෝජිතයන් මිනිස් ලොව සුචරිතයේ යෙදෙමින් පරාර්ථකාමී ව හැසිරෙන්නවුන්ගේ ක්‍රියා කලාපය රන් පත්වල දැහිඟුලෙන් ලියන බව පූජාවලියේ සඳහන් වෙයි.[17] යමක ප්‍රාතිහාර්ය පූජා කථාවල ෂඩ් ශාස්තෘන් පරිභව මුඛයෙන් හෙළා දකින අතර බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාගේ ප්‍රාතිහාර්ය පෑමේ විස්මයාවහ හැකියා ප්‍රදර්ශනය කරන්නේ ජන සිත්සතන් ඇද බැඳලමිනි. තේජෝ, ආපෝ කසිනවලට සමවැදුණු බුදු රදුන් ලොවට ප්‍රකට කළ ප්‍රාතිහාර්ය පිළිබඳ මෙසේ දක්වා ඇත. අතිමානුෂීය ස්වරූපය බුදු රදුනට ආරෝපණය කොට අසන්නන් විස්මයෙන් අලළමින් ශ්‍රද්ධාව තීව්‍ර කරවීම කතුවරයාගේ අභිප්‍රාය වී ඇත. එය ඔහු යට දක්වන ලද අෂ්ට ඵල අතර ද වෙයි.

"එකෙණෙහි නාභියෙන් මත්තෙහි තුන්ලෝ බබුළුවා මහ ගිනිකඳෙක් පැන නැංග. අධඃකායෙන් ආකාශ ගංගාව නික්මුණා සේ මහා ජලස්කන්ධයෙක් නික්මිණි. නැවත ගිනිකඳ නැඟී පූර්වාකාරයෙන් දියකඳ හෙයි..." [18]

සංවර සිතින් බණ ඇසූ ගෝපිකා නම් ශාක්‍ය රාජ කන්‍යාව මරණින් පසු තව්තිසා දෙව් ලොව උපත ලැබීමේ කතා පුවත රසවාහිනිය, සද්ධර්මාලංකාරය[19] ඇතුළු සෙසු මධ්‍ය කාලීන බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය රැසක ම එන්නකි. පූජාවලිය ද එය දක්වයි. මින් පෙනී යන්නේ ගද්‍යකරණයෙන් අපේක්ෂිත අෂ්ට ඵල සාක්ෂාත් කරගනු වස් තත් කාලීන ව ප්‍රකට ව තිබූ රසවත් දේවකථා රැසක් එකට අමුණා දිව්‍ය රාජ පූජා කථාවල බහාලූ බවකි. පූජාර්හ වූ බුදුන්ගේ ගුණ සමුදාය අතිමානුෂික ස්වරූපයකට ඔසවා තැබීමත් ඉන් සිදු විය. පූජාවලිය බුදු ගුණ වැහෙන බුදු සිරිතක් වන්නේ එහෙයිනි.

සමමෙත් පූජා කථා යන මාතෘකාවෙන් යුතු වූ පූජාවලියේ එකුන් තිස් වැනි පරිච්ඡේදයේ දී බුදු රදුන් නසා බුද්ධ රාජ්‍යය පැහැරගැනීමට උත්සාහවත් වූ දේවදත්ත භික්ෂුව සිදු කළ නොයෙක් උපක්‍රම හා ඒවායෙහි අකම්පිත ව වැඩ විසූ බුදු රදුන් පිළිබඳ වර්ණනාත්මක ශෛලියෙන් විස්තර වේ. එහි දී අජාසත් රජු දෙව්දතුන්ගේ බස් අසා පියා මැරැවීමට ක්‍රියා කළ ආකාරය දීර්ඝ ලෙස විස්තර වෙයි. කුඩා වියේ පටන් මහත් පුත්‍ර ස්නේහයෙන් වැඩූ නමුත් බිම්සර රජුට අවසානයේ පුතුගේ පිහිටක් නො වී ය. රජුගේ මරණය සිදු වූයේ පුත්‍රයාගේ අනුදැනුම පිට යි. පියා දඟ ගෙයි ලවා මරණය කඩිනම් කරනු වස් කරයෙන් යටි පතුල් කප්පවා ලුණු, තෙල් බහාලා ගිනි පුපුරෙන් පිලිස්සීමට අජාසත් අණ කළේ ය. බිම්සර රජුගේ අවසාන මොහොත ගැන පූජාවලි කතුවරයා මෙසේ දක්වයි.

"අහො බුදධො, අහො ධම්මො, අහො සඞ්ඝො යි කිය කියා දාකරඬුවක පුදා ලූ මල් දමක් මළා ගියා සේ රජ්ජුරුවෝ පය පැසවන වේදනාවෙන් මිය චාතුම්මහාරාජික නම් දිව්‍යලෝකයෙහි ජනවසභ නම් දිව්‍යරාජ ව ඉපැද ගියහ..." [20]

කතුවරයා සිය අභිමතාර්ථ සිත්හි තබාගෙන කළ වර්ණනයක් ලෙසින් මෙය හඳුනාගත හැකි ය. දෙ වැනි පැරකුම්බාවන් බුදු බව ප්‍රාර්ථනා කිරීම ප්‍රතික්ෂේප කළේ දැඩි පුත්‍ර ස්නේහය නිසා ය. බිම්සර නිදර්ශනය ඇසුරෙන් කතු හිමි ව්‍යංග්‍යයෙන් පවසා සිටින්නේ ජීවිතයේ සැඳෑ සමයේ එක ම පිහිට ලෙස පවතින්නේ පුත්‍ර සම්පත නො ව තෙ රුවන ම පමණක් බව යි.

පූජාවලිය ලියන්නට මයූරපාද හිමියන් උනන්දු කරවූ කරුණු අතර ධර්ම ශ්‍රවණයට පැමිණිය නො හැකි රජ මෙහෙසි ආදි ස්ත්‍රීනට ධර්මය ඉගැනීමේ මාර්ගයක් සලසාදීම තවත් වැදැගත් එකකි. මේ බව මාර්ටින් වික්‍රමසිංහ ද පවසයි.[21] මේ කෘතියෙන් කාන්තාවන්ගේ ශ්‍රද්ධා භක්තිය දියුණු කරවන අතර ම ඔවුන්ගේ යටි සිතෙහි ආත්මාභිමානයකුත් ප්‍රතියමාන කළේ ය. පූජාවලිය උපාසිකාවන් සඳහා ලියැවුණු කෘතියකැ යි පැරණි ජන ප්‍රවාදයක් පවතින බව ගොඩකුඹුර පවසයි.[22] අටළොස් වැනි පරිච්ඡේදයේ පූර්වාරාම පූජා කථා අතර විශාඛා මහෝපාසිකාව ගැන විස්තර දැක්වෙයි. පූජාවලියේ දී උසස් ජීවිත ගත කළ රජ, මැති, මහධන සිටු ආදින්ගෙන් බුදුන් ලැබූ පූජා සමූහයක් පෙන්වා දෙයි. රජගහනුවර ධනඤ්ජය සිටාණන්ගේ (පසු ව හෙතෙම කෝසලයට පැමිණි බව පූජාවලිය දක්වයි) දියණියන් විශාඛාව යි. සත් හැවිරිදි වියේ දී ම සෝවාන් මඟ ඵල ලැබූ ඇය පඤ්චකල්‍යාණයෙන් අග තැන් පත් තැනැත්තියකි.

විශාඛාව විවාහ වූයේ කොසොල් දේශයේ සතළිස් කෙළක් ධනය ඇති මිගාර සිටුවරයාගේ පුත් පූර්ණවර්ධන සමඟ යි. ස්වාමියාගේ සිටු කුලයට අවමන් කරන තරමේ මහා ධනස්කන්ධයක් ඇගේ පියා සතු විය. සතළිස් කෙළක් ධනයට අවමන් කළ විශාඛාවගේ පියා, ධනඤ්ජය සිටුවරයා පැවැසූයේ; "ඒ සම්පත් අපගේ දරුවන්ට කසා නාන මිලටත් මඳ ය"[23] යනුවෙනි. පියා ඇයට සාදා දුන් මේල පලඳනා කර්මාන්තය සඳහා සිවු මසක් ගත විය. නව කෝටි ලක්ෂයක් අගනා පලඳනාව දරා සිටීමට විශාඛාවට ඇතුන් පස් දෙනකුගේ බල පැවැතියේ යැ යි සඳහන් වේ. මෙබඳු කාය බලයක් ද අබරණ සම්පතක් ද හිමි වූයේ පූර්ව භවයක සිඛී බුදුනට අෂ්ට පරිෂ්කාර පිදීමේ අනුහසිනැ යි කියැවේ. කතුවරයා බණ මඩුවට රැස් වූ ගැහැනුන්ගේ චරිත ස්වභාව විනිවිදිනසුලු චින්තන ශක්තියක් ඇති ව සිටියකු බව

තහවුරු වෙයි. මේල පලඳනාවෙහි ලෝභයෙන් හෝ වේ වා රාජකීය කාන්තාවන් දහමෙහි අලවා දන් පින්හි ව්‍යාවෘත කිරීම ඔහුගේ අරමුණු අතර විය.

අසදෘශ මහාදාන පූජා කථා ගොඩනැඟී ඇත්තේ කොසොල් රජු බුදුන් උදෙසා පිදූ, අන්‍යයනට කිසි දා සම කළ නො හැකි මහා දාන පින්කමක් පසුබිම් කරගනිමිනි. කොසොල් රජු පරදවමින් ජනයා බුදුපාමොක් මහ සඟනට දන් පිරිනැමූ හ. පරාජයට පත් ව මුසුප්පුවෙන් ඇඳට වී සිටි රජුට අසදෘශ මහා දානය පිළිබඳ අදහස පවසා හෙතෙම උනන්දු කරවූයේ රජ බිසව වූ කෝසල මල්ලිකාව යි. එක් බුදුවරයකුට සිය දිවියේ එක් වතාවක් පමණක් ලැබෙන මේ මාහැඟි දානය ගැන කතුවරයා ඉදිරි පත් කරන අදහස මෙසේ ය.

"හැම බුදුන් ම ලබන්නා වූ මේ අසදෘශ දානය හැම කාලයෙහි ස්ත්‍රියක ම සංවිධානය කිරීම එයිත් ඒකාන්ත ධර්මයෙක් ම ය" [24]

කාන්තාවට ගර්හා කිරීමේ ක්‍රම විලාසය අනුගමනය නො කොට අවස්ථානුරූපී ව පුරුෂයා හා සමාන ව නැතහොත් පුරුෂයා ද ඉක්මවා යන පරිද්දෙන් කාන්තාවගේ විචක්ෂණශීලීභාවය කියා පෑමට පූජාවලි කතුවරයා සමත් ව ඇත.

සිය පරමාර්ථ සාධනයේ දී මයූරපාද හිමියන් යොදාගත් භාෂා විලාසය ද මෙහි දී සැකෙවින් හෝ සලකා බලනු වටී. පූජාවලිය ලියැවී ඇත්තේ විශාල පරාසයක් නියෝජනය කරන පාඨක, ශ්‍රාවක පිරිසක් වෙනුවෙන් බව කෘතියේ ම එන සඳහනකින් පැහැදිලි විය. එය රජ, බිසෝ හා මැති ගණ මෙන් ම සාක්ෂරතාවෙන් තොර පොදු ජනයා ද ඉලක්ක කරගෙන රචනා වූවකි. මේ හේතුවෙන් පොදුවේ වැටැහෙන භාෂා ශෛලියක් අනුගමනය කිරීමට කතු හිමියනට සිදු විය. සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකාවේ දී වජිරඤාණ හිමියන් පවසනුයේ පොදු ජන සිතුම් පැතුම් ආදියට හා ඔවුන් වහරන බසට ද ඉතා ළං වන අරුතින් හා බසින් සැකැසුණ පාඨ පූජාවලියේ ඇති බව යි. එහි දී කතු හිමියනට ම අනන්‍ය වූ භාෂා විලාසයක් දැකගැනීම උගහට වුව ද උපමා භාවිත කොට කරුණු පැහැදිලි කිරීමට උත්සාහ දැරීමත් ව්‍යවහාර භාෂාවෙන් ලැබූ ආලෝකයත් නිසා පොදු

ශ්‍රාවකයාට මනා සේ ධර්මය වැටැහෙන පරිදි භාෂාව භාවිත කොට ඇත. පහත දැක්වෙන්නේ එකකින් සෑහීමකට පත් නො වී උපමා මාලාවක් ඉදිරි පත් කළ අවස්ථාවකි.

"රුවන් ආකරයක් බල බලා අඟුරු පැස් උකහන්නාසේ හැල් කෙතක් මැද හිඳ කටුසර කන්නකු සේ චින්තාමාණික්‍යයක් බල බලා දවසේ ගල් ගන්නකු සේ"

කෝසල ජනපදයේ බුදුන් වැඩ සිටිය ද මිථ්‍යා දෘෂ්ටි ගත් මිගාර සිටුවරයාගේ ක්‍රියා කලාපය ප්‍රායෝගික ජීවිතයට අතිශය සමීප ව එසේ පැහැදිලි කෙරිණ. තවත් උපමා කිහිපයක් පහත දැක්වේ.

"සිංහරාජයක්හුගෙන් ප්‍රසාද ලත් ඇත්පොව්වකු සේ"[25] "වෙල හස් වන කල අසුවල් වැව හස්වනැයි වැව ගුණ කියවූවා සේ"[26] "මුඛයට පැමිණි ගෝචරය වල දමා ඔබ්බෙන් ගොදුරු සොයන්නා වූ අඥානයා සේ"[27]

පූජාවලි කතුවරයා සිය අභිමතාර්ථ සාධනය පිණිස කෘතියේ බොහෝ ස්ථානවල ජාතක කථා සංක්ෂේපයෙන් දක්වා තිබීම ද වැදැගත් ලක්ෂණයකි. එහි දී කිසියම් පූජා මාත්‍රයක් දක්වන කතු හිමියන් ඊට උපයුක්ත කථා පුවත සාධනය කිරීමට අවශ්‍ය ඓතිහාසික සාධක වශයෙන් සලකා ජාතක කථා පුවත් ගෙන හැර පෑ බවක් පෙනෙයි. සමමෙත් ආදි ජාති භේද පූජා කථාවල දෙව්දතුන් පිළිබඳ පවසන කතුවරයා දෙව්දත් තෙර බුදු රදුන් හා වෛර බැඳීමේ ප්‍රවෘත්තිය දැක්වෙන සේරිවාණිජ ජාතකයේ සිට කථා හතළිස් දෙකක අදාළ අවස්ථා සංක්ෂිප්ත ව ඉදිරි පත් කරනු දැකගත හැකි ය.

මෙහි දී අප සැකෙවින් අවධානයට ලක් කළේ පූජාවලි කතුවරයා සිය කෘතිය රචනා කිරීමේ දී මුදුන් පමුණුවාගැනීමට අපේක්ෂා කළ අභිප්‍රාය හා ඒවා කොතෙක් දුරට ඉෂ්ට ප්‍රාප්ත කර ගෙන ඇති ද යන්න පිළිබඳ යි. පූජාවලියේ තෝරාගත් පරිච්ඡේද කිහිපයක් පමණක් සීමාව වශයෙන් සලකා මේ විමර්ශනය සිදු කෙරිණි. තත් කෘතියේ පරමාර්ථ පිළිබඳ අවධානය යොමු නො කොට හුදු සාහිත්‍ය ග්‍රන්ථයක් ය, යන නිර්ණායකය පමණක් ගෙන සිදු කරන ඇතැම් නිර්දය විවේචන රසක් ම මතිභ්‍රම ගොනුවට

අයත් වන බව මින් පෙනෙයි. පූජාවලි කතුහිමියන් එකිනෙකට වෙනස් වූ විවිධ රචනෝපක්‍රම භාවිතයෙන් ස්වකීය පරමාර්ථ සාධනය කර ඇති බව මෙනයින් සනාථ වේ.

## ආන්තික සටහන්

[1] සිංහල සාහිත්‍ය වංශය, 183 පිට
[2] සිංහල සාහිත්‍යය, 67 පිට
[3] නිකාය සංග්‍රහය, 21 පිට
[4] පූජාවලිය, 18 පිට
[5] එම, 12, 13 පිටු
[6] එම, 17, 18 පිටු
[7] එම, 13 පිට
[8] සිංහල සාහිත්‍ය වංශය, 187 පිට
[9] පූජාවලිය, 805 පිට
[10] සිංහල සාහිත්‍යෝදය කථා, 31 පිට
[11] සිංහල සාහිත්‍යයේ නැඟීම, 119 පිට
[12] බුදුගුණ ලිපිය - සිංහල සාහිත්‍යලතා, 61 පිට
[13] පූජාවලිය, 124 පිට
[14] එම, 458 පිට
[15] ප්‍රස්තාවනා, පූජාවලි - කිරිඇල්ලේ ඤාණවිමල හිමි
[16] පූජාවලි, 453 පිට
[17] එම, 459 පිට
[18] එම, 505 පිට
[19] සද්ධර්මාලංකාරය, 48 පිට
[20] පූජාවලිය, 641 පිට
[21] සිංහල සාහිත්‍යෝදය කථා, 31 පිට
[22] සාහිත්‍යය, 72 පිට
[23] පූජාවලිය, 350 පිට
[24] එම, 433 පිට
[25] එම, 420 පිට
[26] එම, 425 පිට
[27] එම, 637 පිට

## මූලාශ්‍රය නාමාවලිය

**නිකාය සංග්‍රහය.** (සංස්.) (1997) දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඤාණවිමල ස්ථවිර කිරිඇල්ලේ. (සංස්.) (1986) **පූජාවලිය.** කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

**පූජාවලිය.** (සංස්.) (2010) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල. උද්ධෘත පාඨ දැක්වීම සඳහා උපයෝගි කරගන්නා ලද්දේ මේ සංස්කරණය යි.

වජිරඤාණ හිමි, හොරණ. (1992) **සිංහල ග්‍රන්ථ ප්‍රදීපිකා.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී.එස්.බී. (2005) **සිංහල භාෂාව හා සාහිත්‍යය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අමරවංශ නායක ස්ථවිර, කොත්මලේ. (සංස්.) (2000) **සිංහල සාහිත්‍යලතා.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්. (2011) **සිංහල සාහිත්‍යයේ නැඟීම.** රාජගිරියඃ සරස.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර. (2009) **සිංහල සාහිත්‍ය වංශය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගොඩකුඹුර, චාල්ස්. (1999) **සිංහල සාහිත්‍යය.** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, මාර්ටින්. (1991) **සිංහල සාහිත්‍යෝදය කථා සහ සාහිත්‍ය කලාව.** දෙහිවලඃ තිසර ප්‍රකාශකයෝ.